`

ශීර්ෂය 212 - විභාග දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 212 විභාග දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විභාග දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 27 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූලි 15 ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව විභාග දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	වටිනාකම රු.630,000,000 ක් ලෙස තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනය තුල ඇතුලත් කර තිබුණු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පිහිටි හෙක්ටයාර් 1.3596 ක ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරාගැනීමේ කටයුතු මේ දක්වාම අවසන් කර නොතිබුණි.	මෙම ඉඩම රු. 101,902,618.85 මුදලකට පවරා ගැනීම සඳහා කැබිනට් පත්‍රිකාවක් එවා තිබීම නිසා මුදල් අයවැය දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කරන ලදී. මේ වන විට නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් පොලිය ඉවත්කර ගැනීම සඳහා සාකච්ඡා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. එම සාකච්ඡාවෙන් අනතුරුව නැවත කැබිනට් පත්‍රිකාව සංශෝධනය කරගෙන ඉදිරි කටයුතු සිදුකරන බව.	ඉඩමේ නීත්‍යානුකූල අයිතිය පවරාගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	මහවැලි අධිකාරිය විසින් 2021 අප්‍රේල් 24 දින විභාග දෙපාර්තමේන්තුවට පවරා දෙන ලද කොත්මලේ කොට්ඨාශයට අයත් රිවර්සයිඩ් වතු බංගලාව සහ තවත් ගොඩනැගිලි ඇතුළත් හෙක්ටයාර් 0.328 ක ඉඩම 2024 දෙසැම්බර් 31 දින වන විටත්, තක්සේරු කර මූල්‍ය වත්කම් ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි.	ඉඩමෙහි තක්සේරු වටිනාකම ගණනය කර වාර්තාවක් ලබාදෙන ලෙසට 2024 අප්‍රේල් 22 දිනැති අංක 1/10/09 ලිපිය මගින් මධ්‍යම පළාත් ප්‍රධාන තක්සේරුකරු වෙත ඉල්ලීමක් කර ඇත. තක්සේරු කිරීමෙන් අනතුරුව ගිණුම්ගත කිරීම සිදුකරන බව.	ඉඩම තක්සේරු කර මූල්‍ය වත්කම් ප්‍රකාශනයට ඇතුළත් කිරීමට කටයුතු කල යුතුය.
(iii)	දෙපාර්තමේන්තු මුද්‍රණ අංශය වෙත 2018 වර්ෂයේ දී මිලදීගෙන තිබුණු රු.546,264,452 ක් වටිනා Wide Web Digital මුද්‍රණ යන්ත්‍රය සමාලෝචිත වර්ෂයේදීත් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට ඇතුලත් කර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	මෙම අයිතමය සිගාස් වැඩසටනේ මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට එක් කිරීමට කටයුතු කරන ලෙසට නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලදී. ඒ් අනුව 2025 අප්‍රේල් මසදී වත්කමක් ලෙස සිගාස් වැඩසටහනට ඇතුලත් කර ඇති බව.	වත්කම් නිවැරදිව ගිණුම් ගත කල යුතුය.

(iv)	දෙපාර්තමේන්තුව සතු වාහන 24 න් වාහන 09 ක් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව.	වාහන තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයට ඇතුළත් කල යුතුය.
(v)	සමාලෝචිත වර්ෂයේ සිගාස් පරිගණක වැඩසටහනේ සඳහන් මූල්‍ය නොවන වත්කම් තුල කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණු රු. 275,174,790 ක නිමකල වැඩවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	**-එම-**	මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම යටතේ තීරණ ගන්නා පාර්ශවයන්ගේ තීරණවලට ප්‍රමාණාත්මක බලපෑම් සිදුකරන කරුණු මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කළ යුතුය.

(ආ) අත්තිකාරම් ගිණුම් ශේෂ

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	දෙපාර්තමේන්තුවේ සේවය කරමින් සිටිය දී වසර දෙකකට පෙර මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.211,323 ක් වූ ආපදා ණය ශේෂය ආයතන සංග්‍රහයේ XXIV පර්ච්ඡේදයේ 4.4 වගන්තිය අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	නොඉල්ලුම් සහතිකය මගින් ණය ශේෂය පිළිබඳව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධයෙන් එම දෙපාර්තමේන්තුවේ පවතින විමර්ශන කටයුත්තක් හේතුවෙන් මෙතෙක් මරණ පාරිතෝෂිතය ගෙවා නොමැති බව.	ආයතන සංග්‍රහය අනුව ණය ශේෂ අයකර ගැනීමට හැකි සෑම උත්සාහයක්ම ගත යුතුය. මරණ පාරිතෝෂික ගෙවීමේ දී අදාල ණය ශේෂයන් අයකිරීමට අවශ්‍ය පරිදි දත්ත ලැබී ඇති බව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මඟින් තහවුරු කර ගනිමින් නියමිත ගිණුම් ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන මුදල් චක්‍රලේඛයේ 3.1 ඡේදය මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 113(6)(ආ) ප්‍රකාරව සේවය හැරගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු. 226,738 ක් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණු අතර මෙම ණය ශේෂ අවුරුදු 03 ත් 25 ත් අතර කාල පරාසයකට අයත්ව තිබුණි.	එක් අයෙකුගේ හිඟ මුදල කපා හැරීමට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත දැනුම් දී ඇති අතර ප්‍රතිචාරයක් නොමැති බැවින් නැවත විමසීමක් කර ඇති බවද, තවත් ණයකරුවකුගේ ලිපිනය වැරදි බැවින් දැනුම් දීමේ ලිපි නැවත පැමිණ ඇත. ණය අයකර ගැනීමේ ඉදිරි කටයුතු සඳහා නිවැරදි පදිංචි ලිපිනය අත්‍යවශ්‍ය බැවින් ඊට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව හා අනෙක් ණයකරුගේ හිඟ ණය ශේෂය කොටස් වශයෙන් මාස 4ක් තුළ ගෙවා නිම කිරීම සඳහා ණයකරු එකඟත්වය පලකර ඇති බව.	ණය හා අත්තිකාරම් මුදල් ආපසු අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගතයුතුය.

(ඇ) අග්‍රිම ශේෂය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව වෙනත් මූලාශ්‍රවලින් අග්‍රිම ලැබීම්වල එකතුව රු.626,530,588 ක් වුවද දෙපාර්තමේන්තුව විසින් විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනය අනුව එම අගය රු.55,491,999 ක් වූයෙන් ඒ අතර රු.571,038,589 ක වෙනසක් පැවතුණි.	ඉදිරි වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශනයේ ඒ.සී.ඒ -3 ආකෘතිය යෝජනා කර ඇති පරිදි සකස් කිරීමට කටයුතු කරනු ලබන බව.	රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අනුව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතුය.
(ii)	භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව වෙනත් මූලාශ්‍ර ලැබීම් හා භාණ්ඩාගාර ලැබීම් වලින් කරන ලද වියදමේ එකතුව රු.7,472,347,593 ක් වුවද දෙපාර්තමේන්තුව විසින් විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශනය අනුව එම අගය රු.6,901,309,000 ක් වූයෙන් ඒ අතර රු.571,038,593 ක වෙනසක් පැවතුණි.	- එම -	- එම -

(ඈ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.	ගිණුම් පොත් යාවත්කාලීන කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබාදෙන ලද බව.	ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගත යුතුය.
(ii)	මුදල් රෙගුලාසි 1645 (අ) අනුව වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීන කර නොතිබුණි.	- එම -	වාහන ලොග් සටහන් පොත් යාවත්කාලීන කර පවත්වා ගත යුතුය.
(iii)	මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පාඩු ලේඛණය පවත්වා නොතිබුණි.	- එම -	හානි පාඩු ලේඛණය පවත්වා ගත යුතුය.
(iv)	මුදල් රෙගුලාසි 138 ප්‍රකාරව නිලධාරියෙකුට ගෙවීම් සිදු කිරීමේදී එකම දිනක් තුල කාර්යයක් කිහිපයකට ගෙවීම් සිදු නොකෙරෙන පරිදි ලේඛන සකස් කර පවත්වා ගැනීමට ඒ ඒ අංශ හා ගිණුම් අංශය කටයුතු කර නොතිබුණි.	- එම -	ගෙවීම් සිදු කිරීමේදී එකම දිනක් තුල කාර්යයන් කිහිපයකට ගෙවීම් සිදු නොකෙරෙන පරිදි ලේඛන සකස් කර පවත්වා පවත්වා ගත යුතු බව.

(v)	මුදල් රෙගුලාසි 1647 (ඉ) හි දක්වා ඇති නියමයන් අනුව වාහන ලේඛනය පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරමින් පවත්ින බව.	වාහන ලේඛනය පවත්වා ගත යුතු බව.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	**ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය**	**මෙම වාර්තාවේ ඡේද යොමුව**
154 (6) වාර්තාවේ 1.6.1 (අ) (i)	ඉඩම තක්සේරු කර ගිණුම්වලට ඇතුලත් කල යුතුය.	1.6.1 (අ) (ii)
154 (6) වාර්තාවේ 3.3	ඉඩම පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කල යුතුය.	1.6.1 (අ) (i)

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(i)	ඉවතලන කඩදාසි විකිණීමෙන් 2020 වර්ෂයේ සිට 2024 දක්වා ලැබිය යුතු රු.21,387,554 ක්, වාලච්චේන කඩදාසි කම්හලෙන් මේ දක්වා අය කරගෙන නොතිබුණි.	දෙපාර්තමේන්තුව විසින් අයවිය යුතු මුදල් ගෙවා නිම කිරීමට කටයුතු කරන මෙන් අවස්ථා ගණනාවකදී ලිඛිතව දන්වා ඇත. අංක 397063 දරන රු.170,400 වටිනා චෙක්පත මඟින් 2022 වර්ෂයට අදාළව අයවිය යුතු මුදලින් කොටසක් ගෙවීමට සංස්ථාව කටයුතු කර ඇත. ඒ අනුව තවදුරටත් රු.21,387,554 ක මුදලක් දෙපාර්තමේන්තුව වෙත අයවීමට නියමිතව ඇති බව.	ලැබිය යුතු ශේෂ නියමිත පරිදි අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	2024 වර්ෂයේ ආයතන විභාග පැවැත්වීම වෙනුවෙන් රාජ්‍ය ආයතන 03 කින් අයවිය යුතු රු.3,617,601 ක් 2025 අප්‍රේල් 22 දින වන විටත් හිඟව පැවතුණි.	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් රු. 83,797 ක 303740 අංක දරන චෙක්පත කල් ඉකුත් වීම හේතුවෙන් නැවත දින දීර්ඝ කර එවීම සඳහා යවන ලදි. 2024 වර්ෂයේ පවත්වන ලද HDFC බැංකුවේ විභාගයන් 02 ක් සඳහා හිඟ මුදල් පියවන ලෙස අදාල බැංකුව වෙත සිහිකැඳවීම යවන ලදී. ජනලේඛන හා	- එම -

සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි 2024 වර්ෂයේ පවත්වන ලද විභාගයන් 02 ක් සඳහා හිඟ මුදල් පිළිවෙලින් රු. 234,603 ක් හා රු.92,648 ක් බැගින් ලැබී තිබූ චෙක්පත් දෙකක් ගිණුම්ගත කර ඇති බව.

3.2 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	මුදල් රෙගුලාසි 50 (ii) ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් හා නිවැරදිව පිළියෙල කළ යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 26 ක් සඳහා වෙන්කර තිබුණු රු.10,312,300,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.3,659,824,352 ක් ඉතිරිව පැවතුණු අතර පිළිවෙලින් වැය විෂයයන් 2, 7 හා 17 ක ඉතිරිය, සියයට 100 හා සියයට 50ත් සියයට 92ත් අතර හා සියයට 10ත් සියයට 50 ත් අතර විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ සමස්ථ ප්‍රතිපාදනයෙන් සියයට 33 ක් ඉතිරිවීමට ප්‍රායෝගික තත්ත්වයෙන් බැහැරව සිදුකරන ලද සැලසුම් හා දුර්වල ඇස්තමේන්තුකරණය මූලිකවම හේතු වී තිබුණි.	ඒ.සී.ඒ -2 (II) මගින් දක්වා ඇති පරිදි මෙම එකිනෙක වැය විෂයයන් සඳහා ප්‍රතිපාදන ඉතිරිවීම් වෙනුවෙන් හේතු දක්වා ඇති අතර, අපේක්ෂා කල පරිදි , අදාල වියදම් හට නොගැනීම හා ජාතික අයවැය චක්‍රලේඛ 01/2024 අනුව රාජ්‍ය වියදම් කළමනාකරණය හේතුවෙන් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම්හි ඉතිරිවීම් ඇති බව.	අනවධානයෙන් තොරව කටයුතු කර මුදල් රෙගුලාසි 50 (1) ප්‍රකාරව, ප්‍රතිපාදන වෙන්කරවා ගැනීමට කටයුතු කළ යුතුය.
(ii)	**ආයතනික විභාග පැවැත්වීම**		
	සමාලෝචිත වර්ෂයේ ආයතනික විභාග 238 ක් සඳහා රු.මිලියන 920 ක් ප්‍රතිපාදන වෙන් කරගෙන ආයතනික විභාග 86 ක් පැවැත්වීම හේතුවෙන් රු.මිලියන 603 ක ප්‍රතිපාදන ඉතිරිව පැවතියදී වෙනත් දෙපාර්තමේන්තුවල ආයතනික විභාග 86 ක් සඳහා විභාග දෙපාර්තමේන්තුව විසින් අධිකාරී බලයකින් තොරව රු.මිලියන 147 ක මුදලක් එම ආයතනවලින් ලබාගැනීමට කටයුතු කර තිබීම හේතුවෙන් එකම කාරණයට දෙවරක් ප්‍රතිපාදන වෙන්කර තිබුණි.	පිළිතුරු ඉදිරිපත් කර නැත.	නියමිත පරිදි ප්‍රතිපාදන වෙන් කරවාගෙන තිබියදී, රජයේ ආයතනවලින් විභාග පැවැත්වීමට මුදල් ලබා ගැනීමට අධිකාරි බලයක් නොතිබියදී එසේ මුදල් ලබා ගැනීමට කටයුතු කල වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156 හා ආයතන සංග්‍රහයේ II කොටසේ 8.1 හා 8.2 වගන්ති අනුව කටයුතු කළ යුතුය. අනවධානයෙන් තොරව කටයුතු කර මුදල් රෙගුලාසි 50 (1) ප්‍රකාරව, ප්‍රතිපාදන වෙන්කරවා ගැනීමට කටයුතු කළ යුතුය.

3.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව අනුමත ප්‍රතිපාදන සීමාවන් තුළ බැඳීම් හා බැරකම් හඳුනාගත යුතු වුවද, තැපැල් හා සන්නිවේදනය වැය විෂයයෙහි ඉතිරිවීම් ඉක්මවා රු.1,983,049 ක බැරකම්වලට බැඳී තිබුණි.	සහතික පත්‍ර ආදායම් මහා භාණ්ඩාගාරය මගින් පවරාගැනීමත් සමඟ සහතික පත් වලට අදාල තැපැල් ගාස්තුව වැය විෂයයෙන් නිරවුල් කිරීමට ප්‍රතිපාදන හිඟවීම නිසා ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීමට සිදුවී ඇති බව.	සියලුම බැරකම් විධිමත් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කිරීම හා අනාවරණය කිරීමත් මුදල් රෙගුලාසි 94 පරිදි බැරකම් සම්බන්ධයෙන් කටයුතු කිරීමත් සිදු කළ යුතු බව.

3.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1) හා (2) වගන්ති ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදුකර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කරගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදුකරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණි. එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ලිපියක් ඉදිරිපත් කළ නමුත් ඒ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.	2025 වර්ෂයේදී නිවැරදි කිරීමට සටහන් කරගත් බව.	විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.
(ii)	විභාග දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේදී පාසැල් විභාග පැවැත්වීම සම්බන්ධ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි පැවැති දුර්වලතා හේතුවෙන් පවත්වා තිබුණු විභාග 03 කින් එක් විභාගයක් වූ 5 වසර ශිෂ්‍යත්ව විභාගයට පොදුවේ ලකුණු 7 ½ ක් (හතහමාරක්) ලබාදීමට සිදුවී තිබුණු බව විගණනයට නිරීක්ෂණය වූයෙන් ඒ සම්බන්ධව ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් පවත්වා ගතයුතු බවට වූ විගණන නිරීක්ෂණය සඳහා	5 වසර ශිෂ්‍යත්ව විභාගය සඳහා පොදු ලකුණු ලබාදීමට හේතු වූයේ පාසල් විභාග පැවැත්වීම සම්බන්ධව අභ්‍යන්තර පාලන ක්‍රම වේදයෙහි පැවැති දුර්වලතා හේතුවෙන් නොව, ඒ සඳහා සම්බන්ධ කරගත් සම්පත්දායක පුද්ගලයෙකුගේ පුද්ගල බද්ධ සිදුවීමක් හේතුවෙනි. ඒ අනුව ශ්‍රේෂ්ඨාධිකරණයෙහි පවරනු	පාසල් විභාග ඇතුළු සියලුම විභාග පැවැත්වීමේ ආරම්භක සැලසුම් අදියරේ සිට ප්‍රතිඵල නිකුත් කිරීම හා ඉන් ඔබ්බටත් වූ සියලුම ක්‍රමවේදයන් තුළ ප්‍රමාණවත් පරිදි අභ්‍යන්තර පාලනයන් පවත්වා ගැනීමට නිසි ක්‍රමවේදයන්, මාර්ගෝපදේශ හා අධීක්ෂණ ක්‍රමවේදයක් හඳුන්වා දී අභ්‍යන්තර පාලනය මනාව පවත්වා

දෙපාර්තමේන්තුව විසින් පිළිතුරු ලෙස " 5 වසර ශිෂ්‍යත්ව විභාගය සඳහා පොදු ලකුණු ලබාදීමට හේතු වූයේ පාසැල් විභාග පැවැත්වීම සම්බන්ධ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයෙහි පැවති දුර්වලතා හේතුවෙන් නොව ඒ සඳහා සම්බන්ධ කරගත් සම්පත්දායක පුද්ගලයෙකුගේ පුද්ගල බද්ධ සිදුවීමක් හේතුවෙනි. " යනුවෙන් දක්වා තිබුණි. ඒ අනුව විභාග පැවැත්වීමට සම්පත්දායකයින් තෝරාගැනීම, ඔවුන්ට මාර්ගෝපදේශ හඳුන්වාදීම ඇතුළු විභාග ආශ්‍රිත කාර්යයන්වලට අදාල සමස්ථ අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ප්‍රමාණවත් පරිදි පවත්වා නොතිබුණි.	ලැබු මූලික අයිතිවාසිකම් නඩුවකට ලද 286/2024 දරන නඩු තීන්දුව අනුව එම සම්පත්දායක පුද්ගලයාට දඩයක් නියමකර ඇත. එයට අමතරව අපරාධ නීතිය යටතේ අධිකරණ කටයුතු ද ක්‍රියාත්මකව පවතින බව.	ගැනීමට කටයුතු කල යුතුය.

3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	නිරීක්ෂණය වටිනාකම	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය				
මුදල් රෙගුලාසි 104		පාසල් විභාග සංවිධාන ශාඛාව වෙත ගබඩාවෙන් නිකුත් කරන ලද භඩ පටිගත කිරීමේ යන්ත්‍ර 07 ක් සහ ඇගයීම් කටයුතු සඳහා භාරදී තිබුණු භඩ පටිගත කිරීමේ යන්ත්‍ර 16 ක් වශයෙන් වූ භඩපටිගත කිරීමේ යන්ත්‍ර 23 ක් අස්ථානගත වී තිබුණ ද අලාභය අයකරගෙන නොතිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බව.	කාලීනව කටයුතු කරමින් රජයට සිදු වී ඇති අලාභය අයකර ගැනීමටත් වගකිව යුතු නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීමටත් කටයුතු කළ යුතුයි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුව විසින් 2024 වර්ෂයේ පවත්වන ලද විභාග සඳහා රහස්‍ය මුද්‍රණාලයේ මුද්‍රණ	පාසල් විභාගවලට අදාළව සියලුම ප්‍රශ්නපත්‍ර මුද්‍රණය කිරීම පාසල් විභාග (රහස්‍ය) ශාඛාවට අයත් මුද්‍රණාලයේ හා ඩිජිටල් මුද්‍රණ	නිසි අවශ්‍යතාවය මනාව හඳුනාගෙන වත්කම් මිලදී ගතයුතු

	යන්ත්‍ර 05 ක් භාවිතා කරමින් ප්‍රශ්නපත්‍ර 3,250,715 ක් මුද්‍රණය කර තිබුණු අතර 2018 වර්ෂයේ දී රු.546,264,452 ක වියදමක් දරා මිලදීගෙන තිබුණු වෙබ් ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රය උපයෝගී කරගෙන 2024 වර්ෂයේ දී ප්‍රශ්නපත්‍ර 1,721,753 ක් මුද්‍රණය කර තිබුණි. එම ප්‍රමාණය සමාලෝචිත වර්ෂයේ රහස්‍ය මුද්‍රණාලයේ මුද්‍රණ යන්ත්‍ර 05 මගින් මුද්‍රණය කරන ලද සමස්ථ ප්‍රශ්නපත්‍ර ප්‍රමාණයෙන් සියයට 34 කි. ඒ අනුව පිරිවැය රු.546,264,452 ක් වූ යන්ත්‍රය ඌන උපයෝජිතව පැවතුණි.	ඒකකය තුල සිදුකරනු ලබයි. ප්‍රශ්නපත්‍ර මුද්‍රණය සැලසුම් කිරීමේදී විභාගයට බොහෝ කල් ඇතිව මුද්‍රණය සිදු නොකරන අතර මුද්‍රණය කරනු ලබන අවස්ථා තීරණය විභාග කොමසාරිස් (රහස්‍ය පාසල් විභාග) විසින් තීරණය කරනු ලබයි. ප්‍රශ්නපත්‍රයේ පිටු ගණන, විෂය හා කොටස, මුද්‍රණය කළ යුතු ප්‍රමාණය, ඇසුරුම් කිරීමේ ප්‍රමුඛතාවය වැනි සාධක මත හා එහි රහස්‍යභාවය පිළිබඳව ද සලකා එය ඩිජිටල් මුද්‍රණාලය තුළ හෝ රහස්‍ය මුද්‍රණාලය තුළ මුද්‍රණය කරනු ලබයි. ඒ අනුව ඩිජිටල් මුද්‍රණ ඒකකය මගින් එම සාධක සලකා බලා එය ඩිජිටල් මුද්‍රණාලයේ යන්ත්‍ර මගින් හෝ Turnkey මුද්‍රණ යන්ත්‍රය මගින් මුද්‍රණය කරනු ලබන බව.	අතර මිලදීගත් යන්ත්‍ර උපරිම ධාරිතාවයෙන් යුතුව භාවිතා කල යුතුය.
(ආ)	වෙබ් ඩිජිටල් යන්ත්‍රය අලුත්වැඩියාව හා සේවා ගිවිසුම් සඳහා සමාලෝචිත වර්ෂය තුළ දී පිළිවෙලින් රු.12,488,128 ක් හා රු.1,895,080 ක මුදලක් ද වැයකර තිබුණු අතර මෙම යන්ත්‍රය මිලදීගත් අරමුණට මුළුමනින්ම උපයෝජනය නොවීම හේතුවෙන් ඒ ඒ අවශ්‍යතාවය පරිදි ප්‍රශ්නපත්‍ර මුද්‍රණය සඳහා පමණක් භාවිතා කර තිබුණු අතර ඇසුරුම් කිරීමේ පහසුකම යාන්ත්‍රිකව සිදුකර නොතිබුණි. ඒ අනුව ප්‍රශ්නපත්‍ර ඇසුරුම් කිරීමට අමතර ගෙවීම් කිරීමටද සිදුවී තිබුණි.	මුද්‍රණ යන්ත්‍රය 2024 වර්ෂයේදී ක්‍රියා විරහිත වූ අවස්ථාවේදී යන්ත්‍රයේ දේශීය බලයලත් නියෝජිත සමාගම මගින් අළුත්වැඩියා කරගෙන ඇත. යන්ත්‍රයේ වගකීම් කාලය අවසන් වූ පසු වාර්ෂික නඩත්තු හා සේවා ගිවිසුමකට එළඹ ඇත.අදාළ මුද්‍රණ යන්ත්‍රය මගින් ලකුණුදීමේ පටිපාටි, පෞද්ගලික අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලේඛන. විභාග ශාලාධිපති ජ'ර්නල, ඇගයීම් මධ්‍යස්ථාන ජ'ර්නල හා දෙපාර්තමේන්තුවේ වෙනත් ලේඛන ද මුද්‍රණය කරනු ලැබේ. ප්‍රශ්නපත්‍ර ඇසුරුම් කිරීමේ කාර්යය සඳහා ඇති යන්ත්‍ර කොටස දෙපාර්තමෙන්තු අවශ්‍යතාවය හා නොගැළපෙන බැවින් එය භාවිතයට නොගෙන මෙතෙක් එම කාර්යය සිදුකළ අයුරින් ම පළපුරුදු කාර්ය මණ්ඩලයක් යොදවාගනිමින් රහස්‍ය ලේඛන ඇසුරුම් කිරීම සිදු කරන බව.	- එම -.
(ඇ)	ප්‍රශ්නපත්‍රවල රහස්‍යභාවය ආරක්ෂා කිරීම සඳහා රු.8,428,637 ක් වටිනා වෙබ් ඩිජිටල් මුද්‍රණ යන්ත්‍රයේ wrapping Solution කොටසක් 2018 වර්ෂයේ දී මිලදී ගෙන තිබුණ ද දෙපාර්තමේන්තුව දැනට භාවිතා කරන රහස්‍ය ලේඛන ඇසුරුම් ක්‍රියාවලිය සමඟ එම කොටස නොගැලපීම හේතුවෙන් මේ දක්වාම එම යන්ත්‍ර කොටස නිශ්කාර්යව පැවතුණි.	යන්ත්‍රය අළුත්වැඩියා කර දෙපාර්තමේන්තුවේ භාවිතයට ගැනීම සඳහා Heidelberg යන්ත්‍රවල දේශීය නියෝජිත ආයතනය ද ඇතුළුව ආයතන 04 ක් වෙතින් ඇස්තමේන්තු කැඳවා ඇති අතර කිසිදු ආයතනයක් ඇස්තමේන්තු ඉදිරිපත් කර නොමැත. රජයේ මුද්‍රණාලය වෙතින්ද මෙම යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා විමසන ලද නමුත් ඒ සඳහා ප්‍රතිචාරයක් දක්වා නොමැති අතර නැවතත් යන්ත්‍රයේ දේශීය නියෝජිත ආයතනයෙන් විමසීමක් සිදුකර ඇති අතර එම ආයතනය ඒ සඳහා ප්‍රතිචාර දක්වා නොමැති බව.	යන්ත්‍ර කොටස මිලදී ගැනීමේ ක්‍රියාවලියට සම්බන්ධ වූ සියලුම වගකිවයුතු පාර්ශවයන්ගෙන් රජයට සිදුවූ අලාභය අයකර ගැනීමට පියවර ගත යුතුය.

4.2 ප්‍රසම්පාදනයන්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 වර්ෂයේ දී ආරම්භ කරන ලද, 1990 වර්ෂයට පෙර වර්ෂවල විභාග ප්‍රතිඵල ලේඛන මහජනතාව වෙත අවශ්‍ය අවස්ථාවන්හි දී නිකුත් කිරීමට පහසු වන ආකාරයට එම ප්‍රතිඵල ලේඛන පරිලෝකනය (Scan) කර තබාගත හැකි ආකාරයේ මෘදුකාංගයක් නිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය 2024 අගෝස්තු 24 දින නිම කිරීමට සැලසුම් කර තිබුණ ද 2024 දෙසැම්බර් 31 දින වන විටත් එම ව්‍යාපෘතිය නිමකර නොතිබුණු අතර වෙන්කරන ලද රු. මිලියන 15 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.	2025 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය පිරිනමා ඇති බව.	ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් පරිදි ක්‍රියාකාරකම් වල ප්‍රගතිය කාලීනව සමාලෝචනය කරමින් අපේක්ෂිත කාර්යසාධනය ළඟාකර ගත යුතුය.

4.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 9 වගන්තිය අනුව රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතේ 612 වෙනි අධිකාරියේ 4 වගන්තියට අනුව ඇප තැබිය යුතු නිලධාරීන්, ප්‍රමාණය හා ක්‍රමය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරි ලෙස අමාත්‍යාංශ ලේකම්ට කළ හැකි බව දක්වා තිබුණද 2024 දෙසැම්බර් 31 දින දක්වාම දෙපාර්තමේන්තුවේ වගකීම් දරන කිසිදු නිලධාරියෙකු ඇප තැබීමක් සිදුකර නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු ඇප තැබිය යුතු නිලධාරීන් සඳහා ඇප තැන්පත් ගිණුම් විවෘත කිරීමට අවශ්‍ය අයදුම්පත් කැඳවා ඇති අතර, මේ වන විට ලැබී ඇති අයදුම්පත් ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙත ඉදිරිපත් කිරීමට නියමිතව ඇති බව හා අයදුම්පත් භාරදී ඇති නිලධාරීන් විසි දෙනෙකුගේ ඇප තැන්පතු ගිණුමේ පළමු සහ දෙවන වාරික මුදල් 2025 - මාර්තු අප්‍රේල් වැටුපෙන් අයකිරීමට කටයුතු කර ඇති බව.	රාජ්‍ය මුදල් චක්‍රලේඛයට හා රජයේ නිලධාරීන්ගේ ඇප ආඥා පනතට අනුකූලව කටයුතු කල යුතුය.

4.4 කළමනාකරණ දුර්වලතා

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නිරත වන නිලධාරීන් සේවයේ ස්ථිර කිරීම්, උසස් කිරීම් හා විශ්‍රාම ගැන්වීම් සඳහා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන අ.පො.ස (සා.පෙළ) හා අ.පො.ස (උ.පෙළ) විභාගයන්හි ප්‍රතිඵල සනාථ කරගැනීම සඳහා රාජ්‍ය ආයතන විසින් ඉදිරිපත් කර	සහතිකපත්‍ර ශාඛාවේ නිලධාරීන් 37 දෙනෙකු අතරින් ප්‍රතිඵල සනාථ කිරීමේ රාජකාරී කටයුතු පැවරිය හැකිව තිබෙන්නේ 24 දෙනෙකුට පමණි. කාර්ය මණ්ඩලය හිඟවීම නිසා මෙම කටයුතු ප්‍රමාද වී ඇත. තවද ප්‍රතිඵල සනාථ කිරීමේ දී ලේඛනගත රාජකාරීවල එක් එක් පියවරයන් සඳහා විශාල කාලයක් ගතවීම ද මීට බලපා	විභාග ප්‍රතිඵල සනාථ කිරීමේ ක්‍රමවේදය විධිමත් හා කඩිනම් කිරීම තුළ රාජ්‍ය සේවයට සුදුසුකම් ලත් නිලධාරීන් ඇතුලත් වීම සිදුවන බැවින්, මෙම ප්‍රතිඵල සනාථ කිරීම සඳහා විධිමත් හා කඩිනම් වැඩපිළිවෙලක් හඳුන්වා

	තිබුණු ඉල්ලීම්වලින් 7,958 ක් ප්‍රතිඵල සනාථ කිරීමකින් තොරව ඉතිරිව පැවතුණි.	ඇත. ප්‍රතිඵල සනාථ කිරීම කඩිනම් කිරීම සඳහා ලේඛනගත රාජකාරීවලින් බැහැර වූ මාර්ගගත ප්‍රතිඵල සනාථ කිරීමේ ක්‍රමවේදයක් යොදාගැනීමේ හැකියාව පිළිබඳ අධ්‍යයනය කිරීමට යෝජිතය. කෙසේ වුවද මෙම සනාථ කිරීම් කඩිනමින් අවසන් කරන ලෙසට නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලද බව.	දීමට කටයුතු කළ යුතුය.
(ආ)	දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය හා ඊ සේවාවන්ට අදාළ සේවා ගිවිසුම 2021 නොවැම්බර් 30 දින වන විට අවසන් වී තිබුණ ද නිල වෙබ් අඩවිය යාවත්කාලීන කිරීමට 2025 අප්‍රේල් 21 දින වන විටත් කටයුතු කර නොතිබුණි.	මේ වන විට ප්‍රසම්පාදන කටයුතු ආරම්භකිරීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කර ඇති අතර තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් පිරිවිතර සකසා ඉදිරිපත් කර ඇත. කඩිනමින් ඉදිරි කටයුතු කරන ලෙසට නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව.	විභාග දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය හා ඊ සේවාවන් බිඳවැටීම් වලින් තොරව පවත්වා ගැනීමත්, ආරක්ෂිත විධිවිධාන යටතේ රහස්‍යභාවයද ආරක්ෂා කර ගනිමින් පවත්වා ගැනීමත්, බලධාරීන්ගේ වගකීමක් වන අතර, විභාග දෙපාර්තමේන්තුවට අනන්‍ය වූ රහස්‍යතාවය හා විශ්වාසවන්ත බව සියල්ල පිළිබඳවම විග්‍රහ කර සුදුසුතම ක්‍රමවේදයකට යාම සැලසුම් අදියරේ දී කලයුතුම ප්‍රධාන පියවරක් වන බැවින්, තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශයේ උපදෙස් හා මගපෙන්වීමද නිරතුරුවම ලබා ගනිමින් මෙම නිල වෙබ් අඩවිය හා ඊ සේවාවන් සංවර්ධන කර්තව්‍ය සිදු කල යුතුය.

(ඇ) **වියත්පුර නිල නිවාස මිලදීගැනීම**

(i)	විභාග පවත්වන කාලසීමාවන් තුළ දී පාසල් විභාග සංවිධාන, රහස්‍ය (පාසල් විභාග), රහස්‍ය (ආයතනික විභාග), ඇගයීම් (පාසල් විභාග) යන ශාඛාවන්වල සේවයේ නිරත මාණ්ඩලික නිලධාරීන් මධ්‍යම රාත්‍රිය දක්වා සේවයේ යෙදීමට සිදු වී තිබීම හේතුවෙන් ඔවුන්ට දෙපාර්තමේන්තුව අසල නිල නිවාස ලබාදීමේ අවශ්‍යතාවයක් පවතින බව පෙන්වා දී අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගෙන රු.34,700,936 ක මුදලක් වැයකර ලබා ගන්නා ලද නිල නිවාස 03 ක්	නිල නිවාස සඳහා අයදුම් කල රහස්‍ය අංශයේ මාණ්ඩලික නිලධාරින් හට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අයත් නිල නිවාස ලබාගැනීමට හැකිවීම නිසා නිල නිවාස සඳහා අයදුම්පත්‍ර ඉදිරිපත් කල අනෙකුත් මාණ්ඩලික නිලධාරින් හට නිල නිවාස ලබා ගැනීමට හැකි වී ඇති බව.	අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් කර, අමාත්‍ය මණ්ඩලය තීරණය කරන ලද කරුණක් අමාත්‍ය මණ්ඩලය විසින්ම සංශෝධනය කල යුතුය. නැතිනම් තීරණය කරන ලද අරමුණට නිවාස යෙදවීමට කටයුතු කළ යුතුය.

	නාගරික සංවර්ධන අධිකාරිය විසින් දෙපාර්තමේන්තුවට භාර දී තිබුණි. අනුමැතියට පටහැනිව නිලධාරින් තිදෙනෙකුට පමණක් නිල නිවාස ලබා දීමට දෙපාර්තමේන්තුව තීරණය කිරීම හේතුවෙන් නිලධාරීන් බොහෝදෙනෙකු මුහුණ දෙන නවාතැන් ගැටළුවට විසඳුමක් ලැබී නොතිබුණි.		
(ii)	වියත්පුර මහල් නිවාස සංකීර්ණයේ නිල නිවාස 03 ක් 2023 අගෝස්තු 29 දෙපාර්තමේන්තුව වෙත බාර දී තිබුණද එම නිල නිවාස 03 න් දෙකක් භාර දුන් දින සිට 2025 ජනවාරි 01 දක්වා මාස 16 ක් ද අනෙක් නිල නිවාසය විගණිත දින වූ 2025 අප්‍රේල් 08 දක්වා මාස 19 ක් ද නිෂ්කාර්යව පැවතී තිබුණි.	නාගරික සංවර්ධන අධිකාරිය මගින් 2023 අගෝස්තු මස 29 වන දින නිල නිවාස දෙපාර්තමේන්තුව වෙත භාරදීම සිදු කලද නිල නිවාස වල පදිංචිය සඳහා අවශ්‍ය විදුලි උපාංග, Gas Burner සවි කිරීම සහ වායු සමීකරණ පහසුකම් සැකසීම කාර්යයන් ඉටුකිරීම සිදු කල යුතුව තිබුණි. මේ වන විට එම කාර්යය ඉටුකර ඇති බැවින් කඩිනමින් නිලධාරීන් වෙත ලබාදීමට කටයුතු කරනු ලබන බව.	නිවාස, අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් කරන ලද අරමුණු අනුව හා නිසි මාර්ගෝපදේශයකට අනුව යෙදවීමට කටයුතු කල යුතුය.
(iii)	නිවාස ලබාගැනීමට සුදුසුකම් ලත් නිලධාරීන් හඳුනාගැනීම, නිවාස භාරදීම, නිවාස නැවත භාරගැනීමට, ගිවිසුම් ගතවීමට, නඩත්තු කටයුතු සඳහා යනාදී වශයෙන් අභ්‍යන්තර පාලනයන් සහිත මාර්ගෝපදේශයක් පිළියෙල කර රු. 34,700,936 ක් වැයකර මිලදීගත් නිවාස 03 අරමුණුගතව යෙදවීමට හැකි පරිදි සැලසුම්ගත ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතින බව.	- එම -
(iv)	නිලධාරීන් සමූහයකගේ නිවාස අවශ්‍යතාවය විසඳීමට මිලදීගන්නා ලද නිවාස 03 න් 02 ක් 2025 ජනවාරි 01 දින තනි නිවාස ලෙස නිලධාරීන් දෙදෙනෙකුට පමණක් ලබාදීමට කටයුතු කර තිබුණි.	- එම -	අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් කර අමාත්‍ය මණ්ඩලය තීරණය කළ කරුණක් අමාත්‍ය මණ්ඩලය විසින්ම සංශෝධනය කල යුතුය. නැතිනම් තීරණය කරන ලද අරමුණට නිවාස යෙදවීමට කටයුතු කළ යුතුය.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව සිදුකරන විගණන පරීක්ෂණවලින් අනාවරණය කරගත් නිරීක්ෂණය, නිගමනය හා නිර්දේශ ඇතුලත් අභ්‍යන්තර විගණන වාර්තා ආයතන ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතු වුවද දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් 2024 වර්ෂය තුලදී සැලසුම් කරන ලද අභ්‍යන්තර විගණන වාර්තා සංඛ්‍යාව 15 ක් වුවත් අභ්‍යන්තර විගණන වාර්තා 05 ක් පමණක් නිකුත් කර ඇති අතර 2024 ජුනි මාසයෙන් පසු විගණන වාර්තා නිකුත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්තව කොමසාරිස් (අභ්‍යන්තර විගණන) ට අමතරව තවත් නිලධාරීන් දෙදෙනෙක් පමණක් සේවය කරන අතර අභ්‍යන්තර විගණන ලෙස කටයුතු කළ නිලධාරියා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තනතුරේ වැඩ ආවරණය සඳහා පත්කර ඇත. එම නිලධාරියා අනුප්‍රාප්තිකයෙකු රහිතව ස්ථාන මාරු ලබා ඇත. ඉහත කරුණු හේතුවෙන් සැලසුම් කළ පරිදි අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත. එසේම අභ්‍යන්තර විගණන අංශයේ අනෙකුත් නිලධාරීන් අවස්ථානෝචිත පරිදි වෙනත් අංශ වල සේවයේ යොදවා ඇති බව.	දෙපාර්තමේන්තුව තුළ ශක්තිමත් අභ්‍යන්තර පාලන පද්ධතියක් සථාපිත කර අපේක්ෂිත කාර්යසාධනය ළගාකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	මුදල් රෙගුලාසි 133 (1) ප්‍රකාරව අභ්‍යන්තර විගණක විසින් දෙපාර්තමේන්තුවේ මුදල් කටයුතු පිළිබඳව පවත්වන අභ්‍යන්තර පාලන ක්‍රමයට සහභාගි වී එම කටයුතුවල සහ වැරදි හා වංචා වැළැක්වීමට සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්‍යන්තර සෝදිසියෙහි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳ අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වාධීන ඇගයීමක් පවත්වාගෙන යාම සිදු කළ යුතු බව දක්වා තිබුණද 2024 වර්ෂයේ අභ්‍යන්තර විගණන අංශයේ කාර්යසාධනය පරීක්ෂා කිරීමේදී ආයතනයේ වැරදි හා වංචා වැළැක්වීමට සහ අනාවරණය කර ගැනීමට හා අභ්‍යන්තර පාලන ක්‍රම පරීක්ෂා කිරීමට ප්‍රමාණවත් කාලයක් වැයකර නොතිබෙන බව අභ්‍යන්තර විගණන අංශය විසින් නිකුත් කරන ලද විගණන වාර්තා වල දක්වා තිබුණි.	අභ්‍යන්තර විගණන අංශයේ කටයුතු සැලසුම් කළ පරිදි අවසන් කිරීමට නොහැකි වී ඇති අතර, 2025 වර්ෂයේදී ආයතනයේ වැරදි හා වංචා වැළැක්වීමට සහ අනාවරණය කර ගැනීමට පිහිටුවා ඇති අභ්යන්තර පාලන ක්‍රම පරීක්ෂා කිරීමට අවශ්‍ය කටයුතු ඉටු කිරීමට අපේක්ෂා කරන බව.	- එම -